**<u>වෂර් 2021 ක්වූ ජනවාරි මස 19 වන දින උඩපළාත ප්‍රාදේශීය සභා මහ සභා</u>**

**<u>රැස්වීමේ වාතර්ාව</u>**

වේලාව - පෙරවරු 10.00

- ❖ පැමිණීම

| | |
|---|---|
| 01.D.G ගුණසේන මහතා | ගරු සභාපතිතුමා |
| 02.L.N අසේල අමරසේන මහතා | ගරු උප සභාපතිතුමා |
| 03.R.M කීතර්ි රත්නායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 04.A.ධමර්සිරි අගලවත්ත මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 05. .S.A නවරත්න බණ්ඩා මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 06. W.M.G.W.C.B වේරපිටිය මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 07. M.G.R පාලිත අබේරත්න මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 08. R.M උදයකුමාර දිසානායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 09.D.G ජයන්ත කීතර්ිසිංහ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 10.D.W.G හේමකුමාර නයනානන්ද මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 11.R.M ප්‍රේමරත්න බණ්ඩාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 12. M.G මොහොමඩ් මුරාඩ් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 13. W.D.G ගුණතිලක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 14. A.H.A රත්නායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 15. H.M යසස් බණ්ඩාර දෙනුවර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 16.R.G රන්ජන් රාජපක්ෂ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 17.D. ප්‍රසන්න මනෝජ් තිලකරත්න මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 18.A. සමන්ත කුමාර ආරියදාස මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 19.W .ප්‍රේමතිලක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 20. W. ඩිමෝෂි ඥාණලතා මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය |
| 21. A. කාදර් මොහොමඩ් ෆසාල් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 22. තංගවේලු කාමරාජන් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 23.N.R.M.D නවරත්න රත්නායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |

24. කුමාරවේලු කනගරත්නම් මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

25.මුතු නීලමේගම් මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

26.වඩිවෙල් රවී මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

27.H.G සුසිලාවති මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

28.P.T.G වයලා විනෝදනි චන්ද්‍රපාල මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

29. K.W කෝකිලා කුමාරි වරාහේන මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

30. සෙල්වරාජ් කාතරීකා මෙනෙවිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

31. H.G සුබද්‍රා සමරනායක මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

32. G.R චමිලා ෆොන්සේකා මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

33.ගයානී ශ්‍රියාමාලා ඇතුගල්පේ මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

34.පිච්චෙයි සෙල්වපූනේස්වරී මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

<u>සභාවට නොපැමිණි මන්ත්‍රීවරුන්</u>

35 .U.G පාලිත මහින්ද ජිනදාස මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

36.D.M දීසායු මංජුල දිසානායක මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

37.M.G උපචන්ද්‍ර ජයපති මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

38.R.M රවින්ද්‍ර දිනුක රත්නායක මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

39.R.A ධනුෂ්ක ඉන්ද්‍රජිත් මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

40.H.M නීල් සුගත් කුමාර මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

41. K සුප්පයියා ජීවා මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

42.G.A අරුණ ප්‍රසන්න මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

43.වත්සලා චතුරාණි සේනානායක මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

පෙරවරු 10.00ට සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදි.

<u>1.පසුගිය මහසභාවේ සභා වාර්තාව සභා සම්මත කිරීම</u>

පසුගිය 2020 දෙසැම්බර් මස 22 මහ සභා වාර්තාව සහ 2020 දෙසැම්බර් මස 31 දින විශේෂ අයවැය සභා වාර්තාව සභා සම්මත කර ගැනීම.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

පසුගිය 2020 දෙසැම්බර් මස 22 මහ සභා වාර්තාව සහ 2020 දෙසැම්බර් මස 31 දින විශේෂ අයවැය සභා වාර්තාව සභා සම්මත කරන ලෙස ප්‍රකාශ කරන ලදි.

**ගරු යසස් දෙනුවර මන්ත්‍රීතුමා**

පසුගිය 2020 දෙසැම්බර් මස 22 මහ සභා වාර්තාව සහ 2020 දෙසැම්බර් මස 31 දින විශේෂ අයවැය සභා වාර්තාව සත්‍ය වාතර්ාවක් ලෙස පිළිගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු සුභද්‍රා මන්ත්‍රීතුමිය**

එම යෝජනාව මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*ඒ අනුව සභා වාර්තාව ඒකමතිකව සභා සම්මත වන බව මම සදහන් කරමි.*

2. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන

**ගරු සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

( 2) 1.2020.12.08 හා 2020.12.22 දින වල පැවති මහ සභා රැස්වීම් වල අයවැය අවස්ථාවේදී උත්තරීතර සභාවේ ගෞරවයට හානි වන පරිදි ගරු මන්ත්‍රීතුමන්ලා කිහිප පලක්ම අසභ්‍ය වචන භාවිතා කරමින් අශෝභනව හැසිරීම සම්බන්ධව කණගාටු වන අතර මින් ඉදිරියට කුමන ගැටළු මතුවුවත් සභාපතිවරයාගේ ගෞරවය නොව මහ සභාවේ ගෞරවය ආරක්ෂා කරන ලෙසත් ගැටළුවක් ඇත්නම් සාකච්ඡා කර විසදා ගන්නා ලෙසත් එසේ හැසිරීමෙන් වලකින ලෙසත් ගරු සභාවේ අයවැය ඡන්ද පවත්වා පළමුව ඡන්ද 32කින් හා දෙවනුව ඡන්ද 34කින් අයවැය පරාජයට පත් වූ නමුත් පසුව අයවැයට පක්ෂව ඡන්ද 24කුත් විපක්ෂව ඡන්ද 15කුත් ලබා බහුතර මන්ත්‍රී පිරිසකගේ සහයෝගයෙන් අයවැය ජයග්‍රහණය කල බවත් විශේෂයෙන් ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමා අයවැය කෙටුම්පත් අවස්ථාවේ සිට අඩුපාඩු පෙන්වා දි කටයුතු කල බවත් අයවැයට පක්ෂව ඡන්දය දුන් නිසා එතුමා ලොකු ගැටළුවකට මුහුණ දුන් බවත් එතුමා දරන ලද තනතුර පවා අහිමි වූ බවත් නමුත් එතුමා එලෙස කටයුතු කලේ උඩපලාත ජනතාවගේ අභිවෘධරීය සලකා බවත් ඒ සම්බන්ධයෙන් ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමාට විශේෂ ස්තූතියක් පුද කරන බවත් මින් ඉදිරියේදී ගරු සභාවේ ගෞරවය රැකගෙන සභාවේදී කටයුතු කරන ලෙස සියළුම දෙනාගෙන් ඉල්ලා සිටින ලදි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

( 2) 2.උඩපලාත ප්‍රාදේශීය සභාවේ සභා අරමුදල් යොදවා සිදුකරන සංවධර්න යෝජනා ඇතුලත් සිව් අවුරුදු සැලැස්ම සදහා යෝජනා ලබා ගැනීම පිලිබද නිවේදනය සභාවට ඉදිරිපත් කරමින් 2021 වෂර්යේ සිට 2024 වෂර්ය දක්වා සිව් අවුරුදු සැලැස්ම සකස් කල යුතු බවත් 2021 වෂර්ය සඳහා වාෂර්ීක සංවධර්න සැළැස්ම සකස් කර ඇති බවත් 2022,2023,2024 යන වෂර් සඳහා ක්‍රියාත්මක කල යුතු සංවධර්න ව්‍යාපෘති වලට යෝජනා 2021.01.25 දිනට ප්‍රථම ලබාදෙන ලෙස ගරු මහ සභාවට සදහන් කරන ලදි.

( 2) 3. මහ සභා රැස්වීම් පැවැත්වීම සම්බන්ධව ගරු මන්ත්‍රී මණ්ඩලය සහ නිළධාරි මණ්ඩලය දැනුවත් කිරීම පිලිබද පුහුණු වැඩමුළුවක් පැවැත්වීම පිලිබද නිවේදනය සභාවට ඉදිරිපත් කරමින් දිනය පසුව දැනුම් දෙන බව සදහන් කරන ලදි.

( 2) 4. 2021 වෂර්ය සදහා කඩ කාමර බදු ගිවිසුම් අලුත් කිරීම සම්බන්ධයෙන් පළාත් පාලන දෙපාතර්මේන්තුවෙන් එවා ඇති ලිපියෙන් ටෙන්ඩර් කර ඉල්ලුම් කරන ඉහළම ලංසුවට කඩ කාමර ලබා දිය යුතු දන්වා ඇති නිවේදන සභා ගත කරන ලදි.

( 2) 5. 2021 උඩපළාත ප්‍රාදේශීය සභාවේ අයවැය පරාජයට පත්කිරීම සම්බන්ධයෙන් පළාත් පාලන දෙපාතර්මේන්තුව එවා ඇති ලිපිය සභාගත කරන ලදි.

( 2) 6.2020.08.20 දින මහ සභා රැස්වීම් වාථර්ාව, 2020.09.15 දින මහ සභා රැස්වීම් වාථර්ාව, 2020.09.15 දින මහ සභා රැස්වීම් වාථර්ාව යන වාථර්ා සම්බන්ධයෙන් පළාත් පාලන සහකාර කොමසාරිස් කායර්ාලය මඟින් එවා ඇති නිරීක්ෂණ ඉදිරිපත් කරමින් එම වාථර්ා සභා ගත කරන ලදි.

<u>3. සභාව වෙත එවා ඇති සංදේශ/පෙත්සම්/පැමිණිලි/සන්නිවේදන ලිපි සභාවට ඉදිරිපත් කිරිම</u>

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

**සංදේශ/පෙත්සම්/පැමිණිලි/සන්නිවේදන ලිපි** නොමැති බව සදහන් කරන ලදි.

<u>4.කල් දී ඇති ප්‍රශ්න - නැත</u>

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

**කල් දී ඇති ප්‍රශ්න** නොමැති බව සදහන් කරන ලදි.

<u>5.කල් දී ඇති යෝජනා</u>

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

<u>තීරණ අංක 05 (1)</u>

5 (1.1) උඩපළාත ප්‍රාදේශීය සභාවේ වැඩ ඒකකයක් ආරම්භ කිරීමට වැඩබිම් අංගනයක් ඉදිකිරීම හා ඒ සදහා ගල් ටොන් 01 ප්‍රමාණයේ ගල් රෝලක් මිලදී ගැනීම සදහා මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට යෝජනා කරමි.

**<u>ගරු ජයන්ත කීතරිසිංහ මන්ත්‍රීතුමා</u>**

උඩපළාත ප්‍රාදේශීය සභාවේ වැඩ ඒකකයක් ආරම්භ කිරීමට වැඩබිම් අංගනයක් ඉදිකිරීම හා ඒ සදහා ගල් ටොන් 01 ප්‍රමාණයේ ගල් රෝලක් මිලදී ගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

**<u>ගරු උප සභාපති අසේල අමරසේන මහතා</u>**

මෙය ප්‍රාදේශීය සභාවේ කලක් තිස්සේ ඉදිරිපත් කරන යෝජනාවක් බවත් එය අද දින ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ගරු සභාපතිතුමාට ස්තුතිවන්ත වන බවත් කහවත්ත මාගර්ය කඩාගෙන යාමට පටන්ගෙන ඇති බවත් කාපට් එක කැඩී ඇති නිසා අඩි 12 මාගර්ය අඩි 10යක් බවට පත්වී ඇති බවත් මාගර්ය විනාශ වී ගියොත් විශාල මුදලක් වැය කිරීමට සිදුවන නිසා මෙම මාගර්ය අයත් වන්නේ නාගරික සංවධර්න අධිකාරියට බැවින් මෙම මාගර්ය නඩත්තු කරන ලෙස ලිඛිතව නාගරික සංවධර්න අධිකාරියට දන්වා යවන ලෙසත් ජල සම්පාදන මණ්ඩලය විසින් ජල නල එළීම සදහා පළුදු කර ඇති බවත් එනිසා අංගම්මන ග්‍රෝව්හිල් මාගර්ය කැඩී ඇති බවත් මෙම මාගර්ය සභාවට අයිති නිසා සොයා බැලිය යුතු බවත් සැම කොට්ඨාශයකම මාගර් පවිත්‍ර කිරීම් හා වීථි ලාම්පු සවිකිරිමේ වැඩපිළිවෙළක් ආරම්භ කිරිමට කටයුතු කරන බවත් එහිදි උඩපළාත හා දොළුව ලෙස වෙන්කර සැළැස්මකට අනුව සියළුම මන්ත්‍රීවරු නියෝජනය වන පරිදි මාගර් පවිත්‍ර කිරීම් හා වීථි ලාම්පු සවිකිරිම කල යුතු බවත්

ප්‍රදේශයේ මන්ත්‍රීවරයාගේ ස්ථාන පරීක්ෂාව අනුව ප්‍රිමික්ස් දමා කැඩී ඇති මාගර් අළුත්වැඩියා කරන ලෙසත් උඩපළාත ජනතාවට සහන සලසන ලෙසත් සඳහන් කරමින් පුස්සැල්ලාව ප්‍රදේශයේ භූමියක් වැඩ ඒකකය සඳහා තෝරාගෙන ඇති බවත් නිළධාරි මැදිහත් වී එම කටයුතු ආරම්භ කරන ලෙස සඳහන් කරන ලදි.

<u>ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා</u>

විශේෂයෙන් මේ සම්බන්ධයෙන් ගරු වේරපිටිය මන්ත්‍රීතුමා විශාල උනන්දුවක් දැක්වූ බවත් ප්‍රාදේශීය සභාව,මධ්‍යම රජය,පළාත් සභාව මඟින් මාගර් සංවධර්නය කර ඇති බවත් නමුත් ජල සැපයුම් ජනතාවට ලබාදුන් පසු සභාවෙන් මුදලක් අය කලත් එම මාගර් තිබූ තත්වයට නැවත සකස් කිරිම සිදු නොවන බවත් බින්විනෝ හෝටලයට යන මාගර්ය ජල සම්බන්ධතා ලබාදීම නිසා පළුදු වී ඇති බවත් එනිසා මෙම මාගර්වල ගමන් කරන ජනතාව අපහසුතාවයට පත්වන නිසා එනිසා ප්‍රිමික්ස් යොදා මාගර් යථා තත්වයට ගැනීමට මෙය සුදුසු යෝජනාවක් බවත් සඳහන් කරන ලදි.

<u>ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමා</u>

උඩපළාත ප්‍රාදේශීය සභාව තුළ ක්‍රියාත්මක මාගර් නඩත්තුව සඳහා ටොන් එකේ ගල් රෝලක් මිළදී ගැනීමට එකඟතාවය ලැබුණු බවත් නමුත් මිළදී ගැනීමේදි ඉතාම නිවැරදි ප්‍රසම්පාදන ක්‍රමවේදයක් අනුගමනය කල යුතු බවත් එහිදි විදේශීයව පාවිච්චි කර මෙරටට ආනයනය කල ගල් රෝලක් මිලදි ගන්නවාද නැතිනම් අළුතින් නිෂ්පාදන තත්වයේම ගල් රෝලක් මිලදි ගන්නවාද කියා අවධානය යොමු කල යුතු බවත් ගන්නා උපකරණය මෙම කාය්ර සඳහා කෙතරම් දුරට ගැලපෙනවාද යන්න නිසි උපදෙස් ලබාගෙන මිලදි ගත යුතු බවත් නැත්නම් කෙටි කාලයක් තුළ වෙන්දේසි කරන මට්ටමට පත් වූවොත් විශාල පාඩුවක් වන නිසා අත්‍යාවශ්‍යාම අළුත්වැඩියා කටයුතු සඳහා යොදා ගත හැකි සභාවේ සියළු දෙනාගේ අවශ්‍යතා සලකා නිවැරදි ක්‍රමවේදයට මිළදිගැනීම සිදු කරන ලෙස සඳහන් කරන ලදි.

<u>ගරු අගලවත්ත මන්ත්‍රීතුමා</u>

කළමනාකරණ කමිටුවේ සාකච්ඡා කල පරිදි මෙම යෝජනාව ඉදිරිපත් කර ඇති බවත් එහිදි මෙවැනි වැඩ පිළිවෙළක් තුළින් මැෂින් මිලදි ගැනීමට කටයුතු කරන ක්‍රමවේදය කුමක්ද යන්නත් ක්‍රියාත්මක වීම අධීක්ෂණය අවශ්‍ය කම්කරුවන් සපයා ගන්නේ කෙසේද යන්නත් තවම උඩපළාතේ වැඩ ඒකකයක් නොමැති බවත් පළමුවෙන්ම මැෂිමක් මිලදි ගැනීමට යෝජනා කිරිමට අදහස් කල කළමනාකරණ කමිටුව කුමක්ද යන්නත් නමුත් ප්‍රාදේශීය සභාවේ සියළුම මන්ත්‍රි මණ්ඩලය සමඟ සාකච්ඡා කර තීන්දුවක් ගත යුතු බවත් යන්ත්‍ර සූත්‍ර මිළදි ගෙන කෙටි කාලයතින් කැඩි ගියොත් ව්‍යාපෘතිය සම්පූණර්යෙන්ම අඩාල වන බවත් මේ සම්බන්ධයෙන් විධිමත් වැඩ පිළිවෙළක් ඉදිරිපත් කල යුතු බවත් මෙහි භාරකරුවන් කවුද සේවකයින් සිටින අයගෙන් වැඩ කරනවාද අළුතෙන් සේවකයින් බඳවා ගන්නවාද ක්‍රියාකරන්නා කව්ද කොපමන මුදලක් වැය කරනවාද යන්න දැනගත යුතු බවත් මුලින්ම කුලියට මැෂිමක් ලබා ගෙන මෙම කටයුතු ආරම්භ කල යුතු බවත් එහි සාථර්කත්වය මත මිලදී ගැනීම කල යුතු බවත් සභාවේ වැඩ නොවුන නිසා මෙවර ගිවිසුමක් මඟින් උප සභාපතිතුමාට විෂයන් 7ක් යටතේ වැඩ භාර දීම ගැන තමා ස්තුතිවන්ත වන බවත් මෙම ගල්රෝල ලබාගැනීමට ව්‍යාපෘති වාථර්ාවක් සකස්කර සභාවට දන්වන ලෙස සඳහන් කරන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

අපට මැෂිමක් ගන්න මාස 3-4ක කාලයක් ගත වන නිසා පුස්සැල්ලාවේ සභා භූමියේ මාගර් කම්කරුවන් යොදා ගෙන මෙම කටයුත්ත ඉටු කරන බවත් අළුතින් සේවකයින් බඳවා නොගන්නා බවත් කළමනාකරණ කමිටුව යනු අපේ කායර්ාලයේ සිටින ප්‍රධාන නිළධාරින් එකතු වී කරන

සාකච්ඡාවක් බවත් මෙය එහිදී ගත් තීරණයක් බවත් සභාවට ඉදිරිපත් කලේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුව මිලදී ගැනීමට කටයුතු කිරිමට බවත් මීට පෙර බැකෝ යන්ත්‍රය ලබාගැනීමට මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය ඉල්ලා යැවූමුත් වසර 2ක් ගත වූවත් අනුමැතිය නොලැබුණු බවත් එනිසා මේ මාසයේ සිට ආරම්භ කරන්න සූදානම් වන බවත් මෙම කටයුතු කරගෙන යන අතරතුර මැෂිම මිලදී ගැනීමට කටයුතු කරන බවත් තමා ව්‍යාපෘති වාතර්‍ාවක් ලබාදෙන බවත් සඳහන් කරන ලදි.

මේ පිලිබඳව සලකා බැලූ මහ සභාව *මෙම යෝජනාව ඒකමතිකව සහා සම්මත වන බව තීරණය* කරන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

<u>තීරණ අංක 05 (2)</u>

5 (1.2) උඩපළාත ප්‍රාදේශීය සභාවට 2021 වෂර්ය සඳහා

1. මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටුව, 2. තාක්ෂණික සේවා කමිටුව, 3. පරිසර හා පහසුකම් කමිටුව , 4. නිවාස හා ප්‍රජා සංවධර්න කමිටුව යන කමිටු සඳහා ගරු මන්ත්‍රීවරුන් පත්කිරීම සුදුසු බවට යෝජනා කරමි.

මෙම කමිටු පත්කිරීමේදී එක් එක් කමිටුව සඳහා සභාපතිවරයෙකු අනිවායෙර්න් පත් කරගන්නා ලෙසත් කමිටු සඳහා ගරු මන්ත්‍රීවරුන්සියළු දෙනා අනිවායර්යෙන්ම සහභාගී වන ලෙසත් අවධාරණය කරන ලදි.

**<u>ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා</u>**

2021 වෂර්යේ 1.මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටුව, 2. තාක්ෂණික සේවා කමිටුව, 3. පරිසර හා පහසුකම් කමිටුව , 4. නිවාස හා ප්‍රජා සංවධර්න කමිටුව යන කමිටු සඳහා ගරු මන්ත්‍රීවරුන් පත්කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

මෙම කමිටු හතර සඳහා ගිය වසර වල කමිටු ක්‍රියාත්මක වූ ආකාරයටම සියළුම ගරු මන්ත්‍රී මණ්ඩලය යොදවන ලෙසත් අළුතින් පත් වූ ගරු ගයානි ශ්‍රියාමාලා මන්ත්‍රීතුමිය මන්ත්‍රී ධූරයෙන් ඉවත් වූ ප්‍රියංගිකා සෙනෙවිරත්න මන්ත්‍රීතුමිය නියෝජනය කල කමිටුවට පත් කරන ලෙසත් යෝජනා කරමි.

**<u>ගරු ඩිමෝෂී ඥාණලතා මන්ත්‍රීතුමිය</u>**

එම යෝජනාව මම ස්ථිර කරමි.

**<u>ගරු යසස් දෙනුවර මන්ත්‍රීතුමා</u>**

පරිසර කමිටුවේ සභාපති ලෙස ගරු වේරපිටිය මන්ත්‍රීතුමාද තාක්ෂණික සේවා කමිටුවෙහි සභාපති ලෙස ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමාද සුදුසු බවට මම යෝජනා කරමි.

**<u>ගරු ජයන්ත කීතරීසිංහ මන්ත්‍රීතුමා</u>**

එම යෝජනාව මම ස්ථිර කරමි.

**ගරු ඩිමෝෂී ඥාණලතා මන්ත්‍රීතුමිය**

මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටුවෙහි සභාපති ලෙස ගරු උප සභාපතිතුමා සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා**

එම යෝජනාව මම ස්ථිර කරමි.

**ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා**

නිවාස හා ප්‍රජා සංවධර්න කමිටුවෙහි සභාපති ලෙස ගරු අගලවත්ත මන්ත්‍රීතුමා සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු ගයානි ශ්‍රියාමාලා මන්ත්‍රීතුමිය**

එම යෝජනාව මම ස්ථිර කරමි.

**ගරු නවරත්න රත්නායක මන්ත්‍රීතුමා**

පරිසර කමිටුව සඳහා තමාව යොමු කරන ලෙස සඳහන් කරන ලදි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව* මහ සභාව තීරණය කරන ලදි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

තීරණ අංක 05 (1,3)

5(1.3) වරිපනම් ලේඛණයේ නම් වෙනස් කිරීම සම්බන්ධයෙන් පවත්නා ගැටළු නිරාකරණය කඩිනම් කිරීම සඳහා ආදායම් පරීක්ෂක වාර්ථාව මත ගාස්තු වැඩි කිරීම,නම නිවැරදි කිරීම ලේඛණ වල සටහන් කිරීමට මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු උප සභාපති අසේල අමරසේන මහතා**

ඉඩම් වල අයිතිය වෙනස්වීම සම්බන්ධයෙන් ගැටළු ඇති බවත් සමහරු මිය ගිය පසු උරුමය ගැන ගැටළු ඇති වන බවත් බැංකු ණය ලබාගැනීමට යාමේදී ජනතාව අපහසුතාවයට පත්වන බවත් මෙම යෝජනා ක්‍රියාත්මක වූවොත් සභාවේ ආදායම් තත්වය වධර්නය වන නිසා ආදායම් පරීක්ෂක මහතුන් හරහා ගැටළු හඳුනාගෙන කඩිනමින් මෙම කටයුතු ඉටු කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

**ගරු අගලවත්ත මන්ත්‍රීතුමා**

මෙම යෝජනාව ඉතා වැදගත් යෝජනාවක් බවත් ලේඛනයේ නම වෙනස් කිරීම් හිටපු ආදායම් පරීක්ෂක මහතුන් සිදුකල බවත් වරිපනම් ලේඛනයේ නම් වෙනස් කිරීම් සඳහා සභාවට ලිපි භාරදුන් අය වසර ගණනාවක් තිස්සේ ඉල්ලූ නමුත් තවම නොලැබුණු බවත් පුස්සැල්ලාව ප්‍රදේශයේ ඉඩම් වල වැඩි ප්‍රමාණයක් හිමිකරුවන් ඉඩම් විකුණා ඇති නීතිඥ මහතකුගේ අනුමැතියෙන් ගත් ඉඩම් ඇති බවත් වසර 40-50ක් පදිංචිව සිටියත් ඉඩම් හිමියන්ට වරිපනම් සීමාවේ සිටින අයට වරිපනම් ලේඛනයේ නම නොමැති නිසා අයිතිය පිළිබඳව ගැටළු ඇති බවත් එනිසා සභාවේ ආදායම් පරීක්ෂක නිළධාරින්ට ඇති බලය පූණර් ලෙස ලබාදීම සුදුසු බව සඳහන් කරන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මහ සභාව තීරණය කරන ලදී.*

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

<u>තීරණ අංක 05 (1,4)</u>

5(1.4) අනවසර ඉදිකිරීම් සඳහා නඩු පැවරීමේ කටයුතු සඳහා මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට යෝජනා කරමි. පී,ජී , ශාන්ත කුමාර වීරකෝන් මහතා ,මොහොමඩ් පවුසර් මහතා එම් එෆ්,එෆ් නිරූෂා මිය,H.K.M.ෆාරුක් මහතා,T.K.M අමානුල්ලා මහතා, යන අයගේ අනවසර ඉදිකිරීම් පිළිබඳව ගැටළුවක් තිබෙන බවත් සභාවෙන් ඉදිකිරීම් නතර කිරීමට කීවත් නතර නොකරන නිසා කොමසාරිස්තුමා හා ආණ්ඩුකාරතුමාද මේ සම්බන්ධයෙන් දැනුවත් කර ඇති නිසා නඩු දැමීම සභාපතිවරයා ලෙස තමාට තනිව කල නොහැකි නිසා සභාව ගන්නා පියවර කුමක්ද යන්න විමසන ලදී. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදීද අනවසර ඉදිකිරීම් නවත්වන ලෙස සඳහන් කල බවත් තමා උසාවියේ නඩු පැවරීම සඳහා සභා අනුමැතිය ඉල්ලූ බවත් සඳහන් කරන ලදී.

<u>ගරු උප සභාපති අසේල අමරසේන මහතා</u>

ශාන්ත කුමාර මහතාගේ නිවස ඉදිකර ඇති ස්ථානයේ ස්ථාන පරීක්ෂාවට තමා සහ ලේකම්තුමිය, කාමරීක නිළධාරිතුමිය ගිය බවත් ශාන්ත කුමාර මහතාගේ නිවසට පහළින් නිවසේ සිටින අය පෞද්ගලික ප්‍රශ්න මත ඉදිකිරීම් සඳහා විරුද්ධ වී පෙත්සම් යොමු කර ඇති වූ ගැටළුවක් බවත් මෙම ඉඩම හේමලතා යන අයගෙන් වීරකෝන් යන අය මිලදී ගෙන ඇති බවත් මෙවැනි විශාල නිවසක් කැඩීමට අපට හැකියාවක් නොමැති බවත් ඒ සඳහා තමා විරුද්ධ බවත් දෙවන පුද්ගලයා වන මොහොමඩ් ෆවුසර් නැමැති අයට ගමේ සියළු දෙනා ඉදිරියට ගැටළු මතුවන නිසා පෙත්සම් ඉදිරිපත් කර ඇති බවත් අසාධාරණකම් සොයා බැලීම සඳහා මහජන නියෝජිතයින් ලෙස අපි කටයුතු කල යුතු බවත් සභාවට ගොඩනැඟිලි අයදුම්පත් ඉදිරිපත් කල විට භාරගෙන තිබෙන අඩුපාඩු ඇත්නම් නිළධාරින් විසින් අයදුම්කරුවන් දැනුවත් කල යුතු බවත් මෙවැනි තත්වයන් වලදී මහ ජනතාවගේ පාශර්වය ගත යුතු බවත් මේ යෝජනා ගැන සානුකම්පිතව සලකා බලා දැනුවත් කරන ලෙසත් නඩු දැමීම නොකරන ලෙසත් සඳහන් කරන ලදී.

<u>ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා</u>

මෙම අනවසර ඉදිකිරීම් පහෙන් තුනක්ම තමාගේ කොට්ඨාශයේ බවත් ජනතාවට පදිංචි වීමට ඉඩම් නොමැති නිසා පචර්ස් 10ක ඉඩම් කැබැල්ලක නිවාස 2-3 ඉදිකරන බවත් ජනතාව උඩපළාත බල ප්‍රදේශය පුරාම අනවසර ඉදිකිරීම් සිදු කරන බවත් ජනාකීණර් ස්ථාන වල පමණක් මෙම කටයුතු සිදුවන බවත් අපි මහජන නියෝජිතයින් ලෙස ජනතාවට නඩු දැම්මට අකමැති බවත් නමුත් යම් යම් නීතිරීති අනුව ගරු සභාපතිතුමාට කල හැකි දෙයක් නොමැති බවත් ගරු සභාපතිතුමා,ගරු උප සභාපතිතුමා,ලේකම්තුමිය සාකච්ඡා කර තීරණයක් ගන්නා ලෙසත් ප්‍රාදේශීය සභා දේපළ,මාගර්, වත්කම්,ප්‍රධාන කාණු වැනි ස්ථාන ජනතාව අත්පත් කර ගෙන ඇත්නම් ඒ දේවල් වලට නීතිය ක්‍රියාත්මක කරන ලෙසත් නඩු දැම්ම් නොකරන ලෙසත් සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

තමා මෙම සභා තීරණය ගරු ආණ්ඩුකාරතුමාට, පළාත් පාලන කොමසාරිස්තුමාට,ජනාධිපති ලේකම් තුමාට සභාව නඩු දමනවාට අකමැති බව දන්වා යවන බවත් සඳහන් කරන ලදී.

<u>ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමා</u>

ඔබතුමාලා නඩු දමන්න අකමැති නම් මේ කාරණාවේදී අගතියට පත් පාශර්වයට දෙන සහතිකය කුමක්ද යන්නත් මෙම ඉදිකිරීම් සමඟ පහළ නිවසේ සිටින පුද්ගලයාට ආරක්ෂාව ලබාදිය හැකිනම් වගකීම සභාව මහින් ගන්නවා නම් ගැටළුවක් නොමැති බව යම්කිසි කෙනෙකු වරදක් කර ඇත්නම් අදාළ පාශර්වයේ ඉල්ලීමට ඉඩදිය යුතු බවත් සභාව විසින් දුන් තාක්ෂණික උපදෙස් මත අදාළ ඉදිකිරීම කර ඇද්දැයි පරීක්ෂා කල යුතු බවත් නියම ප්‍රමිතියට කර ඇත්නම් සභාව තත්ව පරීක්ෂණ වාර්තාවක් දිය යුතු බවත්නඩුවකට නොයෙනවානම් අගතියට පත් පාශර්වයට දෙන පිළිතුර කුමක්ද යන්නත් එනිසා නියම ප්‍රමිතියට අනුව තීරණය ක්‍රියාත්මක කරන ලෙස සදහන් කරන ලදි.

<u>ගරු වේරපිටිය මන්ත්‍රීතුමා</u>

අනවසර ඉදිකිරීම් සඳහා නඩු දැමීමට අනුමැතියක් ඉල්ලා ඇති බවත් නඩු දැමීම තුලින් අදාළ පාශර්වයට හානියක් වන බව පිලින්නා බවත් නමුත් මේ හානිය තුළ ඉලංගවත්ත කොට්ඨාශය තුළ ප්‍රින්ස් උනම්බුව යන පුද්ගලයාගේ විකුණා ඇති ඉඩමේ වංගුව ඇති ස්ථානයේ නිවාස 08 ක් ඉදිකර ඇති බවත් මේ පිළිබදව සභාව දැනුවත් කලත් මුදල් තිබෙන අය ඉහළ මට්ටමේ නිවාස ඉදිකරන බවත් සභාවේ තාක්ෂණ නිළධාරි ඉදිකිරීම් නතර කරන ලෙස දැන්වූවත් නීතිය ගණන් නොගෙන කටයුතු කරන බවත් මෙම අනවසර ඉදිකිරීම් ගැන ස්ථාන පරීක්ෂාවක් කර නඩු දැමීම කල යුතු බවත් එවිට අධිකරණය යුක්ති සහගතව තීන්දුවක් දෙනු ඇතැයිද ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයට බල ප්‍රදේශයේ අනවසර ඉදිකිරීම් නතර කිරීමට වගකීමක් තිබෙන බව සදහන් කරමින් අනවසර ඉදිකිරීම් සඳහා නඩු පැවරීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මුරාඞ් මන්ත්‍රීතුමා</u>

සාධාරණ විදිහට නීත්‍යානුකූලව ස්ථානීය පරීක්ෂාවක් සිදු කරන ලෙසත් එවිට ඉදිකිරීම් නතර කල හැකි බවත් සදහන් කරන ලදි.

<u>ගරු අගලවත්ත මන්ත්‍රීතුමා</u>

අනවසර ඉදිකිරීම් සඳහා සභාවේ විශාල මුදලක් වැය වන බවත් උසාවියේ අවසාන තීරණය දෙන්නේ සාකච්ඡා මාගර්යෙන් විසඳා ගැනීමට බවත් ඒ සඳහා උසාවි යායුතු බවත් ශාන්ත කුමාර මහතාගේ නිවස ඉදිකර ඇති ස්ථානයට පහළ නිවසේ අය විශාල භියකින් කටයුතු කරන බවත් මෙහි ඉඩම අයිතිකරුගේ බලපත්‍රයේ නම නොමැති බවත් 2වෙනියට නම සදහන් ආඩියාකඩවත නිවසේ බලපත්‍රය ගෙන තිබුනත් සභාවේ අනුමත ප්‍රමාණයට වඩා විශාල ලෙස එම අය තමන්ට අවශ්‍ය ලෙස වෙනස්කර ඇති බවත් ඔවුන් සභාවේ දැනුවත් කිරීම් තාක්ෂණ නිළධාරි උපදෙස් පිළිපදින්නේ නැත්නම් සභාපතිතුමා යවන ලිපියකට පැමිනෙන්නේ නැත්නම් සභාවක් අවශ්‍ය නොවන බවත් එසේ නම් අනිවායර්යෙන්ම නඩු දැමීම කල යුතු බවත් උනම්බුව නිරූෂා මියගේ නිවසද එම අයට අවශ්‍ය පරිදි වෙනස් කර ඇති බවත් ආඩියාකඩවත ෆාරුක් නමැති පුද්ගලයා කාණුව උඩ නිවස හදා ඇති බවත් එවිට සභාව නීතිය ක්‍රියාත්මක කල යුතු බවත් අමානුල්ලා කියන පුද්ගලයාට එම ඉඩමේ කිසිදු අයිතියක් හිමිකමක් නොමැති බවත් එනිසා ජනතාවට සභාවක් සහ නීතීමාලාවක් ඇති බවට දැනුවත් කල යුතු බවත් නඩු පැවරීම සඳහා අනුමැතිය ඉල්ලා ඇති මුත් අපේ මන්ත්‍රීවරුන් ඒ සඳහා අකමැතියි කියන්නේ අනවසර වැඩ සඳහා අපි කැමතියි යන්න බවත් එනිසා දෙපාශර්වයේ සියළු දෙනා කැදවා සතියක් ඇතුළත සාකච්ජා කර අපේ එකඟතාවන්ට එනවා නම් ගැටළුවක් නොමැති බවත් නැත්නම් නඩු මාගර්යට යායුතු බවත් එම අය නීතියට අනුව නියමානුකූලව කටයුතු නොකරනවානම් අපේ ප්ලෑනෙන් පිට කටයුතු කරනවානම් ඉදිකිරීම් කඩා දැමිය යුතු යැයි යෝජනා කරන ලදි. අනවසර

ඉදිකිරීම් සම්බන්ධයෙන් ගරු හේමකුමාර නයනානන්ද මන්ත්‍රීතුමා සහ ගරු පාලිත අබේරත්න මන්ත්‍රීතුමාද අදහස් දක්වන ලදි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මහ සභාව තීරණය කරන ලදි.*

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

තීරණ අංක 05(1.5)

05(1.5) උඩපළාත ප්‍රාදේශීය සභාවේ 2021 වෂර්යේ සෑම මසකම මහ සභා රැස්වීම් පැවැත්වෙන දින සඳහා මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට යෝජනා කරමි.

| | | | | | |
|---|---|---|---|---|---|
| 1.ජනවාරි මස | - | 19 | 2.පෙබරවාරි මස | - | 18 |
| 3.මාතර්‍ු මස | - | 18 | 4.අප්‍රේල් මස | - | 12 |
| 5.මැයි මස | - | 20 | 6.ජුනි මස | - | 22 |
| 7.ජුලි මස | - | 15 | 8.අගෝස්තු මස | - | 19 |
| 9. සැප්තැම්බර් | - | 21 | 10.ඔක්තෝම්බර් | - | 21 |
| 11. නොවැම්බර් මස | - | 23 | 12.දෙසැම්බර් මස | - | 07 |

හදිසි අවශ්‍යතා මත මෙම දින වෙනස් විය හැකි බවත් සඳහන් කරන ලදි.

ගරු යසස් දෙනුවර මන්ත්‍රීතුමා

සභා රැස්වීම් දින පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මහ සභාව තීරණය කරන ලදි.*

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

තීරණ අංක 05 (1,6)

*(5* (1.6) CPLL-7586 කෘෂ කැබ් රථයේ අළුත්වැඩියාව සඳහා වැය වන රු.171028.00ක මුදල ගෙවා ඉන්ද්‍රා ට්‍රේඩසර් ආයතනය මඟින් අළුත්වැඩියා කටයුතු කරගැනීම සඳහා මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට යෝජනා කරමි.

ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා

CPLL-7586 කෘෂ කැබ් රථයේ අළුත්වැඩියාව සඳහා වැය වන රු.171028.00ක මුදල ගෙවා ඉන්ද්‍රා ට්‍රේඩසර් ආයතනය මගින් අළුත්වැඩියා කටයුතු කරගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමා</u>

CPLL-7586 කෘෘ කැබ් රථයේ අළුත්වැඩියාව සඳහා ඉදිරිපත් කර ඇති ඇස්තමේන්තුවේ මිල ගණන් අධික බව සඳහන් කරමින් අදහස් දක්වන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මහ සභාව තීරණය කරන ලදි.*

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

<u>තීරණ අංක 05 (1,7)</u>

5 (1.7) 2021 වෂර්ය සඳහා ටෙන්ඩර් ඉදිරිපත් නොවූ කඩ කාමර නැවත ටෙන්ඩර් කිරීම සඳහා මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට යෝජනා කරමි.

<u>ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා</u>

2021 වෂර්ය සඳහා ටෙන්ඩර් ඉදිරිපත් නොවූ කඩ කාමර නැවත ටෙන්ඩර් කිරීම සඳහා මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු උදය දිසානායක මන්ත්‍රීතුමා</u>

කඩ කාමර නැවත ටෙන්ඩර් කිරීම සඳහා ඉදිරිපත් කර ඇති ලැයිස්තුවේ පන්විලතැන්න හංදියේ කඩකාමර අංක 1,2 හා 3 ලෙස සඳහන් කර ඇති නමුත් මේ සඳහා ජලය හා විදුලිය නොමැති නිසා නිසියාකාරව භාරදීමට නොහැකි වුන නිසා මේ වනවිට එම අය සභාවට තැන්පත් මුදල් ලබා දී ඇති නිසාත් නැවත පන්විලතැන්න හංදියේ කඩකාමර අංක 1, 2 කඩ කාමර සිටින අයටම ලබාදෙන ලෙසත් ඒ හැර අනිකුත් කඩ කාමර ටෙන්ඩර් කිරීම සුදුසු බවට යෝජනා කරමි.

<u>ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමා</u>

මෙම කඩ කාමර සඳහා මුදල් ගෙවූ නමුත් විදුලිය ලබා දී කලින් ටෙන්ඩර් කල අයට භාරදී නොමැති බැවින් එම අයටම නැවත කඩ කාමර ලබාදීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මහ සභාව තීරණය කරන ලදි.*

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

<u>තීරණ අංක 05 (1,8)</u>

5.1,8) පුස්සැල්ලාව නගරය තුළ (කොවිඩ් 19) රෝග ව්‍යාප්තිය පාලනය කිරීමට මහ ජනතාව දැනුවත් කිරීම උදෙසා සන්නිවේදන ඒකකයක් දින 10 ක් සඳහා ස්ථාපිත කිරීමට මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට යෝජනා කරමි.

<u>ගරු යසස් දෙනුවර මන්ත්‍රීතුමා</u>

එම යෝජනාව මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මහ සභාව තීරණය කරන ලදී.*

**කමර්ාන්ත අනුමැතිය**

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

තීරණ අංක 05 (1,9,10)

(5)1.9)නැඩිසා රබමර්ලේ පිහිල්ල දෙසට යන මාගර්ය සංවධර්නය කිරිම - රු.250000.00 කමර්ාන්තය සදහා මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට යෝජනා කරමි.

5 (1.10) නැඩිසා මැද කාසල් මිල්ක් ජනපදයට ජලය ලබාදීම - රු.300000.00 කමර්ාන්තය සදහා මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට යෝජනා කරමි.

*සංශෝධිත කමර්ාන්ත*

(5).2.ගරු ජයන්ත කීතරීසිංහ මන්ත්‍රීතුමාගේ යෝජනා

5 (2.1) මස්ගොල්ල උඩමංකඩුල්ල පාළම අසලින් මිණුවන් වැවට යන මාගර්ය කැපීම රු.200000.00 කමර්ාන්තය වෙනුවට සංශෝධන කමර්ාන්තයක් ලෙස,

ඩී.ජී. ධමර්දාස හිටපු ග්‍රාම නිළධාරී මහතාගේ නිවස අසළින් මුල්ගමවත්ත එච්.ජී.සුභසිංහ මහතාගේ නිවස අසළට යන මාගර්ය කැපීම සදහා මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට යෝජනා කරමි.

ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා

කමර්ාන්ත අනුමැතිය සදහා ඉදිරිපත් කර ඇති ගරු සභාපතිතුමාගේ කමර්ාන්ත යෝජනා සහ ගරු ජයන්ත කීතරීසිංහ මන්ත්‍රීතුමාගේ *සංශෝධිත කමර්ාන්ත* යෝජනා සියල්ල ඉටුකිරීම සුදුසු බවට ගෙන ආ යෝජනා මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මහ සභාව තීරණය කරන ලදී.*

(06) කාරක සභා වාථර්ා *කමිටු වාතර්ා* ඉදිරිපත් කිරීම

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

1. දෙසැම්බර් මාසයට අදාළ ධාවන සටහන් වාථර්ා ඉදිරිපත් කිරීම

2. උඩපළාත ප්‍රාදේශීය සභාව කඩ කාමර ටෙන්ඩර් කමිටු වාථර්ා පිළිගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා

දෙසැම්බර් මාසයට අදාළ ධාවන සටහන් වාථර්ා, කඩ කාමර ටෙන්ඩර් කමිටු වාථර්ා පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනා මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මහ සභාව තීරණය කරන ලදී.*

**07.ආදායම් වියදම් වාතර්ා - නැත**

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*8 වෙනත්*

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

අද දින මාසික මහ සභාවට සහභාගි නොවූ ගරු මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලාගේ නිවාඩු අනුමත කිරිම සදහා සභාවට යොමු කරමින් නිවාඩු ඉල්ලීම් ඉදිරිපත් කරන ගරු මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලා ලිඛිතව ඒ බව සභාවට ඉදිරිපත් කරන ලෙසත් සදහන් කරන ලදි.

ගරු යසස් දෙනුවර මන්ත්‍රීතුමා

අද දින මාසික මහ සභාවට සහභාගි නොවූ ගරු මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලාගේ නිවාඩු අනුමත කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

*ගරු වයලා විනෝදනී මන්ත්‍රීතුමිය*

අද දින මාසික මහ සභාවට සහභාගි නොවූ ගරු මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලාගේ නිවාඩු අනුමත කිරිම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

2021 නව වසරේ ජනවාරි මස මහ සභාවට සහභාගී වූ උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයටත් ලේකම්තුමිය ඇතුළු කායර් මණ්ඩලයටත් භාෂා පවර්ථර්ක මහතාටත්,මාධ්‍යවේදී මහතාටත් ස්තූතිවන්ත වෙමින් සියළු දෙනාට සුභ නව වසරක් ප්‍රාථර්නා කරමින් ප.ව.12.30ට පමණ සභාවේ වැඩ කටයුතු නිමා කරන ලදි.

ලේකම් සභාපති

උඩපළාත ප්‍රාදේශීය සභාව උඩපළාත ප්‍රාදේශීය සභාව